*ප්‍රශ්නය : ඔබ වහන්සේට පෙනෙන අන්දමට බුද්ධ ධර්මයට තියෙන මූලික අභියෝග මොනවාද? ඒ වගේම මේ යුගය තුළ බුද්ධ ධර්මයෙන් සමාජයට යහපතක් කරන්න තියෙන අවස්ථා මොනවාද?*

පිළිතුර : ශ්‍රී ලංකාවේ බහුතර ජනතාව බෞද්ධ. ක්‍රිස්තියානි, හින්දු හා මුස්ලිම් ජනතාවත් බොහෝ පිරිසක් අපේ රටේ සිටිනවා. ආගමික කොටස් වෙන වෙනම ගත් විට ඒ හැම කොටසකට ම එක්තරා විදියක අභියෝගයක් තියෙනවා. විද්‍යාව හා තාක්ෂණය සීඝ්‍රයෙන් දියුණුව වෙත යන මේ ලෝකය තුළ ආගම් වලට බොහෝ අවස්ථා වලදී ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිදු වෙනවා. බෞද්ධ දර්ශනය තුළ ඒ අභියෝග අඩුයි. නමුත් අනෙකුත් ආගමික කොටස් වලට ඒ අභියෝග වැඩියි.

හැම ආගමක ඇති මූලික කරුණු ක්‍රියාත්මක නොවීම අභියෝගයක්. උදාහරණයක් වශයෙන් කෙනෙකුට කරුණාව දැක්වීම හොඳයි කියලා හැම ආගමක්ම එක සේම පිළිගන්නවා. මේක බුද්ධාගමේ පමණක් නෙවෙයි. බෞද්ධයෙකු පමණක් නොවෙයි. ලෝකයේ ඕනෑම කෙනෙකු කරුණාව දැක්වීම කෙනෙකුට පිහිට වීම, උදවු කිරීම, අසරණයෙකු පිහිටි වීම හොඳයි කියලා පිළිගන්නවා. කිසිම ආගමක විශේෂත්වයක් තියෙනවා කියලා මම හිතන්නේ නැහැ. බුද්ධාගමේ තිබෙන විශේෂ දෙය මෛත්‍රිය හා කරුණාව. නමුත් අනෙක් ආගම් වලත් ඒවා වෙනස් දේවල් කියලා මම හිතන්නේ නැහැ. නමුත් ඒවා ක්‍රියාත්මක කිරීමේදී සමාජය තුළ යම් යම් ප්‍රශ්න පැන නගිනවා.

මම හිතන අන්දමට ශ්‍රී ලංකාවේ සමාජයේ, හැම පැත්තකම විශාල පරිහානියක් දකින්න තියෙනවා. ආර්ථික හෝ සමාජයේ හේතුන් එයට බලපාන්න පුළුවන්. ආශ්‍රය හේතු වෙන්නත් පුළුවන්. විදේශ රට වලින් සමාජය තුළට එන යම් යම් බලපෑම්, විවෘත ආර්ථිකය තුළින් ලැබෙන යම් යම් දේ හේතු වෙන්නටත් පුළුවන්.

***ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, අපි බැලුවොත් විවෘත ආර්ථිකය, ගෝලීයකරණය හරහා යම් යම් අභියෝග දැන් මතු වෙනවා. ඔබ වහන්සේ කියනවා වගේ තොරතුරු තාක්ෂණය හරහා බුද්ධ ධර්මයට ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීමක් ඇති වෙලා. බටහිර රටවල් බුද්ධාගම ගැන දැන් ටිකක් හිතන්න පටන් අරගෙන. හැබැයි ශ්‍රී ලංකාවේ බැලුවොත් අපිට අභියෝග රාශියක් තියෙනවා. සංස්කෘතියට, අපේ අනන්‍යතාවයට අභියෝගයක් වෙලා. මේ තත්ත්වයට අපි මුහුණ දෙන්නෙ කොහොමද?***

පිළිතුර : මම හිතන්නේ මේ අභියෝගය හරියට තේරුම් ගැනීම අත්‍යාවශයයි. තේරුම් ගත් පසු එක එක ආගමික කොටස් වෙන් වෙන් වශයෙන් මුහුණ දීම තමයි වඩා සාර්ථක ක්‍රමය. බෞද්ධයින්ට තියෙන ප්‍රශ්න බෞද්ධයින් තේරුම් ගන්න ඕනේ.

*ප්‍රශ්නය : ඒ තේරුම් ගැනීම අපි දැනට ලබා ගෙන තියෙනවාද?*

පිළිතුර : මම හිතන්නේ නැහැ. අපිට ඒ අවබෝධය නෑ.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, ඉතින් අපි කොහොමද ඒ අවබෝධය ගන්නේ ?*

පිළිතුර : නියම බෞද්ධ ජීවිතයක ස්වරූපය අපි හදාරන්නට, සොයන්නට හා බලන්නට හැම විටකම උත්සාහ කරන්න උවමනායි. බෞද්ධ ජීවිතයක් කියන්නේ බොහෝම තෘප්තිමත් ජීවිතයක්. සමහර විට පොළොන්නරුව හෝ ඈත ගම්මානයකට ගියොත් තෘප්තිමත් ජීවිත ගත කරන සමහර පවුල් තියෙනවා. කන්නයක් දෙකක් වගා කර ගත්තා. අස්වැන්න ගෙට ගත්තා. එතැන වට්ටක්කාත් තියෙනවා. එළවලුත් තියෙනවා. වී හාල් ටික තියෙනවා. අඩු පාඩුවක් ඒ මිනිස්සු ළඟ නැහැ. ඒ මිනිස්සුන්ගේ ජීවිත ලඟට අපි ගිහින් අපි විමසුවොත් එතැන බෞද්ධකම රැකිලා තියෙනවා. ආර්ථිකයත්, ගුණධර්මත් ඒ ගොල්ලන්ගේ ප්‍රමාණයට ආරක්ෂා වෙලා තියෙනවා. ලැබී තියෙන සමාජ බලපෑම් අඩුවෙලා. වර්තමාන සමාජය තුළ නොයෙකුත් ආකාරයෙන් එන බලපෑම් ඒ අයට නැහැ. ඒ අය බෞද්ධකම, ගතිගුණ, සිරිත් විරිත් ආරක්ෂා කරගෙන ඉන්නවා.

නමුත් නරගබදට වෙන විට ඔය තත්ත්වය වෙනස්. ඒ අයගේ ඉල්ලීම්, ඉන්න හිටින්න තියෙන ප්‍රශ්න, ආර්ථික ප්‍රශ්න බරපතලයි. සමාජයෙන් එන යම් යම් විශාල බලපෑම් සහ දේශපාලන බලපෑම් තියෙනවා. ඒ සියල්ල එකට එකතු වෙලා මේ නගරබද මිනිස්සු සිටින්නේ ආගමික වටිනාකම් වලින් බොහෝ දුරට ඈත් වෙලා.

***ප්‍රශ්නය : ගම් පලාත් වල තියෙන අපේක්ෂා, බලාපොරොත්තු සමහර වෙලාවට නගරබද තියෙන බලාපොරොත්තු වලට වඩා වෙනස්. ඒ වගේම අද බලන විට විද්‍යුත් මාධ්‍ය හරහා, සමාජයට පෙනෙනවා ලෝකයේ අනෙක් රටවල පුද්ගලයන් ජීවත් වන හැටි. බලාපොරොත්තුත් ඒ අයට දැනෙනවා. ඒ වගේම අපේ මැදපෙරදිග ඇතුළු රටවල වැඩ කරන ශ්‍රී ලාංකිකයන් ලංකාවට පැමිණියාට පසු තවත් බලාපොරොත්තුත් ගෙනෙනවා.***

පිළිතුර : වෙන්න පුළුවන්. නමුත් එතැනදී රජයේ මග පෙන්වීම තියෙන්න අවශ්‍යයි. ඉන්දියාව දෙස බැලුවොත්, ඉන්දියාව විශාල රටක්. ලෝකයෙන් එන ඒ වගේ බලපෑම් වලින් ඉන්දියාවේ මිනිස්සුන්ගේ ජීවිත වෙනස් කරන්න බැරි වෙලා බව පෙනෙනවා.

*ප්‍රශ්නය : ඒ ඇයි ස්වාමින්වහන්ස?*

පිළිතුර : අන්න ඒක තමයි වටිනාකම. ඒක තමයි අගය කරන්න ඕනේ. ශ්‍රී ලංකාව බටහිර ජාතින් තුනකට යටත් වෙලා හිටිය රටක්. ඒ නිසාම අපේ මේ වෙනස් කම ඇති වුනාය කියලාත් කියන්න බැහැ. මේ වෙනස යටත් වීම් තුළ සිදු වු දෙයක්ම නෙමෙයි. ක්‍රමාණුකූලව, ටිකෙන් ටික තදබල ලෙස විවෘත ආර්ථිකය පැත්තට හේත්තු වුණා. මේ

එන බලපෑම් නිසා රටේ සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ ජීවන ක්‍රමය තුළ ඉන්න නොහැකි වුණා. වෙනස් වෙන්න සිදු වුණා. එහෙම වෙනස් වුන අංශ ලංකාවේ තියෙනවා. එතැනදි රජයක් වශයෙන් ක්‍රියාත්මක වීම අවශ්‍යව තිබුණා. ඉන්දියාවෙ එහෙම වෙනවා. අමුතු බලපෑමක් නෙමෙයි. ඒ මිනිසුන් රජයේ රාමුව තුළින්, පාලනය ක්‍රමාණුකූලව සකස් කර දී තියෙනවා. තමන්ගේ රට, තමන්ගේ නිෂ්පාදන ගැන තමන්ගේ දේවල් ගැන හිතන්න. දැන් ලංකාව ගත්තොත් අවුරුදු 57 ක් වෙනවා නිදහස ලබලා. අපි ඒ ගැන හිතන්න ගියොත් අපි රටක් හැටියට බොහෝ දේවල් වලින් පස්සට ගිහින්.

*ප්‍රශ්නය : අපි ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයක් තුළ ජීවත් වන නිසාත් වෙන්න පුළුවන්. මෙය සිදුවුනේ කාගේ වරදින්ද කියලා කියන්න පුළුවන්ද? ඡන්ද දායකයින්? නැත්නම් නායකයන් දුර්වලද?*

පිළිතුර : විධිමත් දුර දක්නා නුවණකින් යුතු සැලසුම් සහගත වැඩපිළිවෙලක් පැවැති රජයයන් විසින් යොදලා නැහැ.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ කියන විදියට ඉන්දියාවේ අනන්‍යතාවය කියන එක පැහැදිලිව ඉන්දියානු ජාතිකයාට තියෙනවා. කොයි ප්‍රාන්තයෙන්, ආවත් ඉන්දියාව කියන එක තියෙනවා. ආහාර, අහන සංගීතය, අඳින ඇඳුම් පැළඳුම් වෙන්න පුළුවන්. කොතරම් බටහිර ලෝකයට ඇතුල් වුනත් ඉන්දියානු අනන්‍යතාවය තියෙනවා. නිව්යෝක් නගරයට ගියත් ඉන්දියානු ජාතිකයා හැසිරෙන්නේ එකම ආකාරයකට. අපි එහෙම නැහැ වගේ. ඔබ වහන්සේ කියන්නේ යටත් විජිත යුගය නිසා නෙමෙයි එහෙම වෙලා තියෙන්නේ අපේ තියෙන දුර්වලතාවය නිසා.*

පිළිතුර : ඔව්. මම නම් දකින්නේ අපේ ආරම්භය, අපි සමහර නායකයින් අගය කරනවා එක එක අංශ වලින්. අපේ රට කෘෂි කාර්මික රටක්, අවුරුදු දහස් ගණනක ඉතිහාසය අනුව තේරුම් අරගෙන රටේ ස්වරූපය, දියුණුව, කල්පනා කරලා සැලසුම් කිරීමක් කළේ නැහැ කවුරුත්. බටහිර යටත් කරගෙන ඉඳලා අපිට දුන්නා. අපි එතැන ඉඳලා කරගෙන ගියා. නමුත් කළ යුතුව තිබුණේ ටිකක් ආපස්සට ගොහින් බලලා, ඒ අනුව ඉදිරි වැඩ පිළිවෙල සකස් කර ගැනීමයි.

*ප්‍රශ්නය : දැන් මේ මොහොතේ අපි කරන්න අවශ්‍ය කුමක්ද? සමාජයේ එක කොටසක් කියනවා අපි අපේ උරුමය සොයාගෙන යා යුතුයි කියලා. නමුත් අද ලෝකය අනුව එතැන්ට යන එක ප්‍රායෝගික නැහැ. මොකද නැපෝලියාව වගේ රටවල් එහෙම කරන්න ගිහින් සමාජය සම්පූර්ණයෙන්ම විනාශ වුණා. නමුත් ඔබ වහන්සේ කියනවා වගේ අපේ උරුමය පදනම් කරගෙන තමයි ගමන යන්න ඕනේ. ගමන සැලසුම් කරන්න අවශ්‍යයි. අපි කොහොමද ඒක කරන්නේ ?*

පිළිතුර : මම හිතනවා අපේ ඓතිහාසික වටිනාකම්, සංස්කෘතිය ගැන කථා කරන්න ගියාට අපේ උරුමය කියන්නේ කුමක්ද යන්න බොහෝ දෙනෙකු දන්නේ නැහැ. අන්න ඒ අවබෝධය විවිධ අංශ වලින් ජනතාවට ලබා දීම අවශ්‍යයි. විවිධ ආගමික කොටස්, කවර ජාතිකයන් මේ රටේ හිටියත් මේ කියන අපේ පැරණි උරුමය සියලු දෙනාම පිළිගන්න අවශ්‍යයි. සීගිරිය අමුතුවෙන් කාටවත් අයිති නැහැ. සීගිරිය අපි කාටත් අයිතියි. ඒක ලෝක වටිනාකමක් තියෙන දෙයක්. මේ රටේ සියලුම ජාතින් හා ආගමිකයන් අන්න ඒ අවබෝධය ලබාගන්න උවමනායි. නැත්නම් මේ ගමන අපිට යන්න බැහැ. ඉන්දියාව බලන්න. ආගම් වශයෙන්, ජාතීන් වශයෙන් කොච්චර වෙනස් වුනත් ඒ ගමන එකට යන්නේ ඒ නිසා. මේ වෙනස කරන්න මුල් විය යුතු රජය හා පාලන තන්ත්‍රය තමයි.

*ප්‍රශ්නය : මූලික එකඟතාවය අපි ලබා ගන්නේ කොහොමද? දැන් ඉන්දියාවේ ගාන්ධි මැතිතුමා, නේරු මැතිතුමා වගේ අයට තමාගේ උරුමය ගැනත්, අනාගතය ගැනත් විශාල දර්ශනයක් තිබුණා. අපේ ශක්තිමත් නායකයන් සිටිය නමුත් මම හිතන්නේ නැහැ අපිට ශක්තිමත්ව ඒ ගමන යන්න පුළුවන් වුණා කියලා. මේ මොහොතේ දි අපි ඒක දිහා බලන්නේ කොහොමද?*

පිළිතුර : මේ සඳහා අපි කවුරුත් අපට සිදුවූ වැරදි පිළිඅරගෙන අනාගතයේ දී කවුරුත් එකතු වෙලා යන්න අවශ්‍යයි. ක්‍රමය මෙයයි කියලා තීරණය කරන්න අවශ්‍යයි. සෝභිත හාමුදුරුවෝ පසුගියදා කථාවකදී කිව්වා ''අපි යන්න ඕනේ මාක්ස් හෝ ලෙනින් පාරේ නෙමෙයි, අපි යන්න ඕනේ බුදු හාමුදුරුවෝ ගිය පාරේ කියලා කියන්න සූදානම් වෙන්න'' කියලා. අපේ රට යන්න මාක්ස් හෝ ලෙනින් ගිය පාරක නෙමෙයි යා යුතු. එය අපිට කවදාවත් යන්න පුළුවන් ගමනක් නෙවෙයි. අපේ පසුබිම මොකක්ද? අපේ උරුමය මොකක්ද? පදනම මොකක්ද? ඒක තවමත් කඩන්න බැරි වුණා. ඒ පදනම තියෙනවා. ඒ පදනමට ගිහිල්ලා ඒක පැහැදිලිව වටහාගෙන තමයි එතැනින් ගමන ආරම්භ කරන්න අවශ්‍ය. ආපස්සට එක්තරා ප්‍රමාණයක් අපිට යන්න වෙනවා. පස්සට ගිහිල්ලා හරි ශක්තිමත් අවබෝධයකින් යුතුව අපි ඒ ගමන ආරම්භ කරමු.

*ප්‍රශ්නය : ඔබ වහන්සේට පෙනෙන විදියට අද තරුණ සමාජය පන්සලට කිට්ටු වෙනවාද? ඈත් වෙනවාද?*

පිළිතුර : මම නම් දකින්නේ ඉතාම සීමිත ප්‍රමාණයක් තමයි පන්සලට කිට්ටු වෙන්නේ. බොහෝ තරුණ කොටස් අතරමං වෙලා. බොහෝ අයගේ ජීවිත සාමාන්‍ය පෙළ හා උසස් පෙළ වෙන විට කඩා වැටෙනවා. සීමිත පිරිසක් තමයි උසස් අධ්‍යාපනයෙන් ඉදිරියට යන්නේ. අනෙක් බොහෝ ප්‍රමාණයක් අතරමං වෙනවා. රැකියාවක් නැහැ. කරන්න දෙයක් නැහැ. විහාරස්ථානයකට එන්නේ බොහෝ සීමිත පිරිසක්. දහම් පාසල් අධ්‍යාපනය තුළ ඉන්නේ සීමිත පිරිසක්. සමහර කොටස් දේශපාලන වශයෙන් එක එක

කණ්ඩායම් වලට එකතුවෙලා පොස්ටර් ගහනවා. පෙළපාලි යනවා. ඉන් එපිට ගමනක් නැහැ. එය අරමුණක්, බලාපොරොත්තුවක් ඇතිව යන ගමනක් නෙමෙයි.

*ප්‍රශ්නය : එතැන වෙනස් කරන්න පුළුවන් ද?*

පිළිතුර : ඒ අයට පැහැදිලිව මේ අවබෝධය දෙන්න අවශ්‍යයි. අනෙක් අයට වඩා තරුණ කොටස් වලට විශේෂයෙන්ම අපේ උරුමය, අපි යා යුතු මඟ, අපේ අතීතය ගැන අවබෝධයක් දිය යුතුයි. හැබැයි මේ පිළිබඳ මනා අබෝධයක් ඇති, ඒක වටහා ගත් භික්ෂූන් එයට සිටිය යුතුයි. දේශපාලන පක්ෂ වලට අදහස් නැඹුරු කර ගත්ත අය නෙමෙයි. රටේ උරුමය මේකයි. අපිට වැරදුනු තැන මෙතනයි. අපි යන්න ඕනේ මෙහෙමයි. කියන්න පුළුවන් භික්ෂු නායකත්වයක් අපට අවශ්‍යයි. එතකොට අනිවාර්යයෙන්ම පාලකයන් නැඹුරු වෙනවා. ජනතාව බලාපොරොත්තු වන්නේ මේ වගේ එකට එකතු වී දියුණුව කරා ගන ගමනක්.

***ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, භික්ෂුන් වහන්සේලා අතර ඒ සම්මුතිය හදා ගන්නේ කොහොමද?***

පිළිතුර : මං හිතනවා භික්ෂුන් වහන්සේලගේ එකමුතු අවස්ථා ගණනාවක් තිබුණා. දැන් එක්තරා අන්දමකට භික්ෂූන් වහන්සේලා දේශපාලන වශයෙන් බෙදිලා. මෙය ඉතාමත් කණගාටු දායක, අවාසනාවන්ත බෙදීමක්. නමුත් 1956 දී ලංකාවේ භික්ෂූන් වහන්සේලා එක පැත්තක් කරා යොමු වුණා. රට, ජාතිය, භාෂාව වගේ කාරණා මුල් කරගෙන එකතු වුනා. නමුත් ඒ ගමන සාර්ථකව යන තරමට සැලැස්මක්, අරමුණු ක්‍රමානුකූලව සකස් කර ගැනීමක් සිදු වුනේ නැහැ. සීමිත පල ප්‍රයෝජන අනුව වැඩ කරන්න ගිහින් සියල්ල ඇද වැටුණා.

***ප්‍රශ්නය : ඔබවහන්සේ කියන හැම ප්‍රශ්නයකම මුල අධ්‍යාපන ක්‍රමය. දහම් පාසල් අධ්‍යාපනයෙන් පටන් ගෙන පාසල් අධ්‍යාපනය, වෘත්තීය පුහුණු, විශ්වවිද්‍යාල යන සියල්ලම එයට ඇතුලත්. ඔබවහන්සේට අත්දැකීම් රාශියක් තියෙනවා අධ්‍යාපන ක්‍රමය ගැන. අධ්‍යාපන ක්‍රමය තුළ ඇති විය යුතු වෙනස්කම් මොනවාද?***

පිළිතුර : යම් යම් පැලැස්තර දම දමා යනවා මිසක් ඇත්ත වශයෙන් ම ඉංග්‍රීසින්ගේ යුගයේ පටන් ගත් අධ්‍යාපන ක්‍රමය තුළ පැහැදිලි වෙනසක් ඇති වුණා කියල අද වුණත් කියන්න බැහැ. මොකක් හරි පනතක් ගේනවා. මොකක් හරි රෙගුලාසි දානවා. පදනම තුළම මිය යනවා. ඒ නිසා රටට අවශ්‍ය උගතුන් බිහි කිරීමක් නැහැ. එහෙම වුනා නම් තරුණයින් අද නිශ්පලව රස්තියාදු වෙන්නේ නැහැ. අද රටේ ශ්‍රම අවශ්‍යතාව කොතරම්ද කියන්න බැහැ. මේසන් බාස්වරු, වඩු බාස්වරු, තේ වතු පොල් වතුවල වැඩ කරන්න

මිනිස්සු උවමනායි. මිනිස්සු ඉන්නවා. නමුත් මේ එක වැඩකටවත් වැඩක් නැහැ. මේ එක් වැඩක්වත් හරියට කරන්න පුහුණුවක් නැහැ.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, අපේ සමාජය තුළ ශ්‍රමයට, දහඩියට ගරු කරන්නේ නැති නිසා එතැනත් ප්‍රශ්නයක් තියෙනවා. මේසන්, වඩු කාර්මිකයන් කියන පුද්ගලයාට උපාධි ධාරියෙක්ගේ මට්ටමට සමාජය තුළ ගරුත්වය තියෙන්න අවශ්‍යයි. නමුත් අද අපේ සමාජය බලන්නේ වෙන විධියකට. උපාධිය තමයි මූලික ඉලක්කය. ඒක අසාර්ථක වුනොත් තමයි අනෙක් අවස්ථා දිහා බලන්නේ. ඔබ වහන්සේ කියන විදියට අවස්ථා රාශියක් තියෙනවා අපේ රටේත්, මැදපෙරදිගත්. නමුත් තරුණ තරුණියන් ඒකට ඇතුල් වෙන්න අකමැතියි වගෙයි?*

පිළිතුර : අකමැත්තක්ම නෙමෙයි මං හිතන විදියට. මේසන් වරුන් කියලා පුහුණු කරද්දි නියම පුහුණුවක් දෙන්න ඕනේ. ඊළඟ අවස්ථාව දෙන්නත් උවමනායි.

*ප්‍රශ්නය : ඔබවහන්සේ හිතන්නේ සමාජයට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ කියලද?*

පිළිතුර : නැහැ සමාජයේ ප්‍රශ්නයක් නැහැ. දැන් බොහෝම වෙනස් වෙලා. කලින් ඒ වගේ කෙනෙකුට ආවාහ විවාහ කටයුත්තකදී එහෙමත් ප්‍රශ්න ඇති වුනා මේසන්, වඩු වැඩ කරන කෙනෙක් කියලා. නමුත් අද ආර්ථිකය බොහෝ වෙනස් වෙලා. අද ඔවුන් සෑහෙන වැටුපක් ගන්නවා. ඉතින් ඒ මනුස්සයා එක්ක යන එක අද සන්තෝෂයට කාරණාවක්.

*ප්‍රශ්නය : නිසි ප්‍රමිති තුළ පුහුණුවක් නැති එකත් අද ලංකාවේ ප්‍රශ්නයක්?*

පිළිතුර : ලංකාවේ දැනට පුහුණුව කියන එක ඉතාම අසාර්ථකයි. කවර අංශයක් බැලුවත් එහෙමයි. රිය පැදවීම අංශය බැලුවත් ලැබෙන්නේ ඉතාමත් අසාර්ථක පුහුණුවක්. මේ ඔක්කෝම විනාශ සිදු වන්නේ ඒ නිසානේ. රිය පදවන්න, මේසන්, වඩු කාර්මික වැනි වෘත්තීන් වල අයට හරියට පුහුණු කරලා සහතිකයක් දෙන්නේ නැහැ. ඒ අඩුපාඩුව මේ රටේ තියෙනවා.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ රිය පැදවීම ගැන කථා කළා. නීතියත් මේ රටේ තියෙන විශාලම ප්‍රශ්නයක්. අපිට අමාරු වෙලා තියෙනවා නීතිය ක්‍රියාත්මක කරන්න. එය නිවැරදි කර හදා ගන්නේ කොහොමද ස්වාමින් වහන්ස?*

පිළිතුර : පාසලෙන් පටන් ගන්න අවශ්‍යයි. ළමා කාලේ සිට විනයට ගරු කරන්න හුරු කරවන්න උවමනායි. ඉස්සර ලොකු මහත්තයා පාරට බැහැලා බලන් ඉන්නවා ළමයි යන්නේ පාරේ වම් පැත්තෙන්ද, දකුණු පැත්තෙන්ද කියලා. එදා විනය කියා දුන්නේ ඒ

ක්‍රමයට. අද ඒ මොනවත් නැහැ. දැන් පුංචි කාලේ ඉඳලා ගෙදර විනයක් නැහැ. පුහුණුවක් නැහැ. ගෙදර ප්‍රශ්න බරපතලයි. ඉස්සර ගෙදර දී මව්පියෝ හුගාක් දේ ළමයාට කියා දුන්නා. අද එයට වේලාවක් නැහැ. ඒ අය ගෙවල් වල නැහැ. ගෙදරින් දෙන දේත් අද නැහැ. පාසලින් දෙන දේත් අද නැහැ. විනය ගරුක පුරවැසියෙක් හදන්න අවශ්‍ය කරන බොහෝ දේ අද අපට නැහැ. අපි නිකං බලාගෙන ඉන්නවා හැදෙයි කියලා. නමුත් හැදෙන්නේ නැහැ.

***ප්‍රශ්නය : අද අපේ අධ්‍යාපන ක්‍රමයට විප්ලවයක් අවශ්‍යයි. එය පටන් ගත යුතු කොතැනින්ද? රජය හරහා බලාපොරොත්තු වෙනවාද? නැත්නම් සිවිල් සමාජයේ බලපෑම් හරහා කරගන්න හැකිද?***

පිළිතුර : යම් යම් අවස්ථාවලදී තමන්ගේ දරුවන්ට ඇති ප්‍රශ්න නිසා සිවිල් සමාජය කල්පනා කරනවා අධ්‍යාපනය ආසාර්ථකයි, දරුවන්ට අනාගතයක් නැහැ කියලා. නමුත් පොදුවේ පාසල් ළමුන්ගේ අධ්‍යාපනය සඳහා රජය විසින් ගැඹුරු වැඩපිළිවෙලක් සකස් කළ යුතුයි. එතැන දි කණ්ඩායමක් විරුද්ධ වුණා. තවත් කණ්ඩායමක් විරුද්ධ වුණා. යනුවෙන් නෙමෙයි. ඕනෑම කෙනෙක් හිතන්නේ රට හදන්න. එය හෙට, අනිද්දා නැත්නම් මාසයක දෙකක වැඩක් නෙමෙයි. අවුරුදු 20 කදී රට මෙතැන්නට ගෙන එනවා කියා නිශ්චිත සැලසුමක් ඉදිරිපත් කරන පුද්ගලයා ගැන විශ්වාසය තබන්න අවශ්‍යයි. ජනතාව රජය ගැන විශ්වාසය තැබිය යුතුයි.

***ප්‍රශ්නය : ඔබ වහන්සෙ හරියට හරි. මගේ මතයත් එය තමයි. අද ඒ විශ්වාසය නැති එක තමයි මූලික කාරණය. නායකත්වය ගැන සමාජයේ විශ්වාසයක් නැහැ. එය ඇති කර ගන්නේ කොහොමද?***

පිළිතුර : විශ්වාසය ඇති වෙන්නේ ක්‍රියාත්මක වීමෙන්. නායකයා දෙවැනි මාසයේ, තුන් වැනි මාසයේ යන්නේ මෙතැන්ට යනුවෙන් ඔහුගේ වැඩපිළිවෙල අනුව ජනතාව විශ්වාස කරනවා. නමුත් දැන් තියෙන තත්ත්වය අනුව එලෙස විශ්වාසය රඳවන්න බැහැ. මන්ද දැන් නායකයන්ට එහෙම වැඩපිළිවෙලක් නැහැ.

***ප්‍රශ්නය : ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයක් අපි බිහි කරලා තියෙනවා. ඔබ වහන්සේට පෙනෙන විදියට මේ ප්‍රජාතන්ත්‍රවාදි රාමුව අපේ සමාජයට ගැලපෙනවා ද?***

පිළිතුර : ඇත්ත වශයෙන්ම අපේ රට දියුණු කරන්න මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැලපෙන්නේ නැහැ.

***ප්‍රශ්නය : මෙන වාගේ වෙනස්කම් ද සිදු වෙන්න උවමනා.***

පිළිතුර : මේ රටේ ජනතාව දැන් වැඩ කරන්නේ නැහැ. රජයේ දෙපාර්තමේන්තු, කාර්යාල ආදියේ ආදියේ ඇත්තේ හිස් තැනක්. තරමක් හරි වැඩ කරන්නේ පුද්ගලික අංශයේ ආයතන වල විතරයි. ඒ කෝටුවක් තියාගෙන වැඩ ගන්න නිසා. අනික් සියලු දෙනා වැඩ කරන්නේ නැති මිනිස්සු. බොහෝ දෙනෙක් වැඩකරන්නේ නැතිව පඩි ගන්න එකයි. හොරකම් කරන එකයි විතරයි කරන්නේ. ලංකාවේ සාමාන්‍ය තත්ත්වය ඒයයි. ඉතින් මේ රට කිසිම කෙනෙකුට හදන්න බැහැ. සමහර දෙනාගේ හැඟීමක් තියෙනවා ඉහළ ඉඳලා පහල මට්ටම දක්වා සියලු දෙනා හොරු, වැරදි කාරයෝ, වංචාකාරයෝ කියලා. ඒක බරපතල හානියක්. ජනතාවට පළමු වැනි තැන, දෙවැනි තැන ඉඳලා ආදර්ශයක් තිබිය යුතුයි. මම පරිත්‍යාගයෙන්, කැපවීමෙන් වැඩ කරන පුද්ගලයෙක් කියන විශ්වාසය ඉක්මනින් ජනතාව අතරට දෙන්න අවශ්‍යයි. අවංක බව, කැප වීම, විශ්වාසය කියන ටික ජනතාව අතරට කාන්දු වුනේ නැත්නම් ජනතා විශ්වාසය දිනා ගන්න බැහැ. දැන් ඒ විශ්වාසය බිඳිලා. විටින් විට එක එක පැති වලට ආණ්ඩු පෙරලුනාට පොදුවේ බැලුවාම නායකයන් පිළිබඳව ලංකාවේ විශ්වාසය නැහැ.

***ප්‍රශ්නය : ස්වාමීන්වහන්ස ක්‍රියාවෙන් තමයි විශ්වාසය දිනා ගන්න හැකි වන්නේ එහෙමද?***

පිළිතුර : සම්පූර්ණ ඇත්ත. දැන් අපිට ආදර්ශ වශයෙන් සිංගප්පූරුව, මැලේසියාව වැනි අපිට ආසන්න රටවල් ගත හැකියි. ඒ රට වල ජනතාව ලී ක්වාන් යූ, මහතීර් මොහොමඩ් වැනි නායකයින් රට හදනවා කියලා විශ්වාස කළා. ඒ නිසා කිසිම විරෝධයක් නැහැ. මහජනතාව කැපවීමක් කළා. ඒවගේ තත්ත්වයකට ලංකාව ගමන් කිරීම අවශ්‍යයි.

***ප්‍රශ්නය : ප්‍රජාතන්ත්‍රවාදය කියලා අපි කරන දේත් වැරදියි සමහර විට ප්‍රජාතන්ත්‍රවාද ගැනත් සමාජයේ විශ්වාසය බිඳිලා. ඇතමෙකුගේ මතය ඒකාධිපති ක්‍රමය අපිට ගැලපෙන බවයි.***

පිළිතුර : ඒකාධිපති ස්වරූපයම නෙමෙයි. මේ රට හදයි යනුවෙන් ජනාතාව තුළ විශ්වාසයක් ඇති කරන අවංක මිනිසෙක්. හොරකම් කරලා නැහැ. වංචා කරලා නැහැ. ජනතාවට පීඩා කරදර කරලා නැහැ. මේ රට හදන්න දැන උගත්කම් තියෙන පුද්ගලයෙක්. දේශපාලන වශයෙන් දැනුමකුත් තියෙනවා. රට ගැන අවබෝධයක් තියෙනවා. මේ රටේ ඉතිහාසය, උරුමය, පරිසරය, ගස් කොළන්, පොළව ගැනත් හොඳින් දන්නා අය අවශ්‍යයි. එයා මේ රට හදයි. අන්න ඒ විශ්වාසය ජනතාව තුළ තියෙන නායකයෙකු අවශ්‍යයි. දැන් ලංකාවේ නායකයන් හා පාලකයන් පිළිබඳව ඒ විශ්වාසය ඇති වෙනවා බොහෝම අඩුයි. සිදු වෙන්නේ එක එක අවස්ථා වල ආණ්ඩු පෙරලීමක් පමණයි.

*ප්‍රශ්නය : විශ්ව විද්‍යාල ක්‍රමය තුළ තියෙන මූලික අභියෝග මොනවාද? සෑහෙන ප්‍රශ්න තියෙනවා. මේ ක්‍රමයට ඉදිරියට යන්න අමාරුයි. ඒ වගේම අවශ්‍ය ප්‍රතිසංස්කරණ කර ගන්නත් අපිට අමාරු බව පෙනෙනවා.*

පිළිතුර : රටට අවශ්‍ය කරන උගතුන් නෙමෙයි අපි විශ්ව විද්‍යාලයෙන් බිහි කරන්නේ ඉංජිනේරුවෝ, වෛද්‍යවරු වගේ ඉතාම සීමිත පිරිසක් බිහි කරන එක ඇත්ත. නමුත් විශ්ව විද්‍යාල අධ්‍යාපනය තුළ වැඩි පිරිසක් බිහි වන්නේ රටට අවශ්‍ය අය නෙමෙයි. අද බොහෝ ව්‍යාපාරිකයෝ මුහුණ දී සිටින බරපතලම ප්‍රශ්නය තමයි ඒ ව්‍යාපාර ඉදිරියට ගෙනයන්නේ කොහොමද කියන එක. තේ පැක්ටරිය කරන කෙනාට ගැලපෙන ශ්‍රමය නැහැ. ඒ මනුස්සයාට තියෙන බරපතලම ප්‍රශ්නය තමයි මිනිස්සු නැති කම. පොල් අක්කර පනහක් තියෙන එක්කෙනාට ඉඩම නඩත්තු කර ගන්න මිනිස්සු නැහැ. නමුත් කලා උපාධි පාස් කරලා කිසි වැඩක් නැතිව බොහෝ අය රටේ නිකම් ඉන්නවා.

*ප්‍රශ්නය : විශ්ව විද්‍යාල වලින් උපාධි ලබා ගත්ත. විශ්ව විද්‍යාලයට ඇතුල් වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්න තරුණ තරුණියෝ ඔබ වහන්සේ කියන දේ පිළිගනියිද? මේ සඳහා ආකල්ප වෙනස් කිරීමක් කරන්න සිදුවෙනවා නේද?*

පිළිතුර : ඔව්. සම්පූර්ණයෙන්ම ආකල්ප වෙනස් කිරීමක් කරන්න සිදු වෙනවා. දැන්නම් ඉතින් ඒ අයට දන්නවා මේ උපාධි අරගෙන වැඩක් නැති බව. ඒ නිසයි උපාධියට ඉගෙන ගන්නේ නැතිව වෙනත් දේ කරමින් ඉන්නේ. කලා උපාධි කරන බොහෝ දෙනෙක් බොහෝම කලාතුරකින් තමයි උනන්දු වෙලා උපාධිය ගන්නේ. අනිත් අය වැඩි දෙනෙක් අවසාන අවස්ථාව දක්වාම කාලේ ගත කරනවා. නොයෙක් විප්ලව, ව්‍යාපාර කරනවා. මොකද උපාධිය ගත්තත් වැඩක් නැහැ. ලැබෙන අමුතු ප්‍රතිඵලයකුත් නැහැ. රැකියාවක් ලැබෙන්නෙත් නැහැ. යන ගමනකුත් නැති බව ඒ අය දන්නවා. කාලාන්තරයක් තිස්සේ තියෙන තත්ත්වය එයයි.

*ප්‍රශ්නය : මේ තත්ත්වය රටට විශ්වාස කරන්න පුළුවන් විදියකට පැහැදිලි කරන්න උවමනායි. මේවා තමයි තියෙන අවස්ථා. මේ තමයි යා යුතු ගමන කියලා. එය කරන්නේ කොහොමද?*

පිළිතුර : අධ්‍යාපන ක්‍රමයේ විශාල පරිවර්තනයක් කරන්න අවශ්‍යයි. අපේ රටට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් තවමත් සකස් වෙලා නැත්තේ ඇයි? ඒ ගැන අපි හිතමු.

*ප්‍රශ්නය : මම හිතන්නේ එතැනත් දේශපාලනය විසින් බොරු අපේක්ෂා, බොරු බලාපොරොත්තු දීලා. අන්තිමට පරම්පරා තුනක් විතර විනාශ කරලා තියෙනවා.*

පිළිතුර : ලේසි නැහැ. ඒ තත්ත්වය වෙනස් කර ඉදිරියට යන ගමන ලේසි නැහැ. හරි අමාරුයි. නමුත් ජනතා විශ්වාසය දිනා ගත් පාලකයෙකුට අමාරු වෙන්නෙත් නැහැ.

***ප්‍රශ්නය : දහම් පාසල් අධ්‍යාපනය ගැන බැලුවොත් එතැන මොකක්ද අපිට කරන්න තියෙන්නේ ස්වාමීන් වහන්ස?***

පිළිතුර : දැනට සතියේ එක දවසක නැත්නම්, දවස් දෙකක සීමිත පැය ගණනක්. ළමයි පන්සල කියන පරිසරය තුළ, ආගමික ගොඩනැගිලි තුළ එකතු වෙනවා. ආගමික පරිසරය තුළ හිඳගෙන ආගමික කරුණු රාශියක් ඉගෙන ගන්නවා. දහම් පාසල තුළ දිනපතා පාසලක තිබෙන අවිනීත, අසංවර කම් බොහෝ දුරට අඩුයි. පරිසරය එයට බලපා තියෙනවා. ඒ නිසා කවදාවත් විප්ලවයක් කරන්නේත්, රතිඤ්ඤා පත්තු කරන්නෙත් නැහැ. කාරණාව ඒ පරිසරය තුළ එය කරන්න බැහැ. නමුත් පාසලේ පරිසරය තුළ අනිවාර්යයෙන් එවැනි දේ වලට ඇදී යනවා. ඒකට යොමු කරන පිරිසකුත් සිටිනවා.

ආනන්ද විද්‍යාලයේ සිද්ධිය මුල් කර ගෙන ළමයි ප්‍රචණ්ඩ ලෙස හැසිරුනේ ඒ නිසයි. යම් යම් බලපෑම් තිබුණා. ඒ වගේ සිද්ධි නරකයි. නමුත් දහම් පාසලේ එහෙම වෙන්නේ නැහැ. එතැන තියෙන පරිසරය තුළ එක්තරා ආකාරයක හික්මීමක්, විනයක් තියෙනවා.

***ප්‍රශ්නය : සතියකට දවසක් හැරෙන්න මේ හරහා ම විනය තව ටිකක් හදා ගන්න වෙනත් අදහස් තියෙනවාද ? ඔබ වහන්සේ කියන විදියට පරිසරය තුළ හැසිරීම වෙනස් කරනවා නම් ඒ අවස්ථාව අපිට ප්‍රයෝජනයට ගන්න පුළුවන්ද?***

පිළිතුර : ළමා ජීවිත වලට මේ ටියුෂන් ක්‍රමය තුළත් මහ විශාල හානියක් සිදු වෙනවා. අසංවරය, අවිනීත කම තදින් බලපානවා. තව දවසක් වෙන් කරගෙන එක්තරා ක්‍රමයකට ඒ පහසුකම් මේ දහම් පාසල තුළ දෙන්න පුළුවන්නම් වැදගත්. පරිගණක අධ්‍යාපනය සලසන ආයතන දැන් පන්සල තුළ ආරම්භ කරලා තියෙනවා. ඒවගේම ඉංග්‍රීසි අධ්‍යාපනය. පන්සල අවට සහ පන්සල තුළ තිබෙනවා. එතැන අර ළමයින්ගේත් සංවරය, විනීතකම තියෙනවා. පන්සලේ ගත කරන පැය හය පැය දොලහක් කරන්න පුළුවන් නම් එය දරුවන්ගේ ජීවිත වලට සැහෙන්න බලපානවා.

***ප්‍රශ්නය : ඒ කියන්නේ අලුත් අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කරනවා නම් මේ අදහස් ඇතුල් කරන එක හොඳයි. ඒ වගේම තොරතුරු තාක්‍ෂණය පන්සල් ආශ්‍රයෙන් කෙරෙනවා. එකට දැන් තියෙන අභියෝග මොනවාද ස්වාමීන්වහන්ස?***

පිළිතුර : පන්සල මේ කියන තොරතුරු තාක්‍ෂණ අධ්‍යාපනය පිළිබඳ වැඩි අවබෝධයක් තියෙන ආයතනයක් නෙවෙයි. අලුතෙන් ම අවබෝධය ලබා ගන්න අවශ්‍යයි. ඒ අවබෝධය ලබා ගැනීමත් එක්තරා විදියක ප්‍රශ්නයක්. ඒ නිසා අලුතෙන්ම එතැනට ඇතුල්

වුනාම පන්සලේ අපිම දන්නේ නැහැ කොහොමද කරගෙන යන්නෙ කියලා. ඒ නිසා තොරතුරු තාක්ෂණ අවබෝධයක් භික්ෂූන් වහන්සේලාට ලබා දෙමින් දියත් කිරීම තමයි අවශ්‍ය. ආරම්භ කළාට මදි ඒ පිළිබඳව හොඳ තේරුමක් බේරුමක් ඇති පිරිසකුත් අවශ්‍යයි. ප්‍රධාන වශයෙන් තියෙන අභියෝගය ඒ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන පිරිසට තියෙන අවබෝධය ප්‍රමාණවත් නැති කම. පසුගියදා මම පානදුරේ පරිගණක පාඨමාලා හදාරණ ආයතනයක සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවයකට සහභාගි වුණා. එතැන විදේශිකයන් කණ්ඩායමක් පවා නැවතිලා ඉංග්‍රීසි හා පරිගණක අධ්‍යාපනය ලබා දීමට සැහෙන වැඩපිළිවෙලක් තියෙනවා. පාසල් අධ්‍යාපනයෙන් පසු ළමා පිරිස දවසින් වැඩි කාලයක් මේ පන්සලට ඇවිත් ගත කරනවා. දහම් පාසල් අධ්‍යාපනයේ සීමිත පැය ගණන හැර මේ කියන පහසුකම් ටික සපයලා පැය ගණන වැඩි කරන්න ක්‍රියා කරනවා නම් මම හිතනවා එය දරුවන්ගේ ජීවිතයට වඩාත් බලපාන්න ඉඩ තිබෙනවා.

***ප්‍රශ්නය : අවසාන වශයෙන් ඔබ වහන්සේට පෙනෙන විදියට මේ රටේ වෙනසක් කරන්න එක දෙයක් තියෙනවා නම් මුලින් කළ යුතු වෙනස කුමක්ද?***

පිළිතුර : මම හිතනවා එම වෙනස නම් අධ්‍යාපනය. නමුත් කාගේත් අනුමැතිය ඇතිව එය කළ යුතුයි. ඒ පිළිබඳ සැලකිල්ලක් දක්වන, උනන්දුවක් දක්වන, ඒ ගැන අවබෝධයක් තියෙන, ජාත්‍යන්තර හා දේශීය වශයෙන් අධ්‍යාපනය ලබා ගත්, උපාධි සමත් වූ අය මේ රටේ ඉන්නවා. මේ කවුරුත් එකතු වෙලා අපේ රටට අවශ්‍ය අධ්‍යාපනය මේකයි කියලා බොහෝම සීමිත කාලයකින් හඳුනා ගන්න පුළුවන් නම් හොඳයි. රට මෙතැන ඉඳලා අනුගමනය කළ යුතු ක්‍රමය ලබන අවුරුද්දේ, මීළඟ අවුරුදු විස්ස තුළ මේ අන්දමටයි වශයෙන් යන වශයෙන් සැලසුමක් අපට අවශ්‍යයි. පළමුවැනි එක එතැනයි. විනයත් එතැන. දැනුමත් එතැන. රටේ ඉදිරි ගමනට අවශ්‍ය කරන පිරිස අපි මෙතැනින් රටට දෙනවා. ලෝකයට දෙනවා. මේ අධ්‍යාපනය තුළයි මේ වෙනස කරන්න ඕනේ. නිදහස් අධ්‍යාපනය අපි මහත් සේ අගය කරන දෙයක්. නමුත් සමහර විට එකත් අද අභියෝගයට ලක් වෙලා. නිදහස් අධ්‍යාපනයේ වරප්‍රසාද ලබා ගත් උදවිය අද මොකක්ද රටට කරන්නේ? එවැනි පිරිසෙන් බොහෝ දෙනෙක් ලංකාව වෙනුවෙන් ශත පහක දෙයක් කරනවාද? එහි ප්‍රතිඵල ලබා ගත් උදවිය මොන ආකාරයෙන් ද රටට සේවය කරන්නේ. ඒ නිසා අද ඒ තත්ත්වයත් අභියෝගයට ලක් වෙලා.

***ස්තූතියි ස්වාමීන්වහන්ස.***